# ශ්‍රී ලංකා පොලිසියේ අලි බලන්නා තනතුර සඳහා බඳවා ගැනීම.

1.0 ශ්‍රී ලංකා පොලිසියේ අලිබලන්නා තනතුරු 02 ක් සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 වෘත්තීය පරීක්ෂණයෙන් සහ යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් ලකුණු අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

3.0 වැටුප :- අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, අලිබලන්නා තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය PL 2 - 2016 , රු.25,250/- 10x270/- 10x300/- 10x330/- 12x350/- රු.38,450/- වේ. රු.28,250/= න් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස් වීම ද රු.31,280/= න් ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස් වීමද රු.34,600/= න් ඔබ්බට යාම සඳහා විශේෂ ශ්‍රේණියට උසස් වීමද ලබා ගත යුතුය. එම චක්‍රලේඛයේ II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

4.0 මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔවුන් යටත් විය යුතු වේ. තව ද, ඔවුන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට නිලධාරීන් විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

5.0 සුදුසුකම් :- අලි බලන්නා තනතුර සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

a. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
b. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
c. අවම අධ්‍යාපන සුදුසුකම් :- 08 ශ්‍රේණිය සමත්වීම.
d. පළපුරුද්ද :- තනතුරට අදාළව වසර දෙකක පළපුරුද්දක් තිබිය යුතුය.
e. කායික සුදුසුකම් :- ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
f. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් **අයදුම්පත් කැඳවන දිනයේ** හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

6.0 වෘත්තීය පරීක්ෂණය :-

අලි බලන්නා තනතුරට අදාළව වෘත්තීය නිපුණතාවය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය (අලි බැලීම හා අලි භාෂාව පිළිබඳ ඇති දැනුම ප්‍රායෝගිකව පරීක්ෂා කරනු ලැබේ)

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :-

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| තනතුරට අදාළ ක්ෂේත්‍රය පිළිබඳව ඇති දැනුම | 35 |
| අතිරේක පළපුරුද්ද | 40 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ දක්වන කුසලතාවය | 05 |
| එකතුව | 100 |

සටහන - තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් පිළිගත හැකි සහතික මඟින් සනාථ කළ යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතුය.

7.0 ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුදුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

8.0 පහත සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය.

9.0 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා පොලිසියේ අලි බලන්නා තනතුරට බඳවා ගැනීම"** යන්න සඳහන් කරන්න. අයදුම්පත්‍ර **2019.06.07** දිනට පෙර එවිය යුතුය.

10.0 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් පොලිස්පති විසින් **වෘත්තීය පරීක්ෂණය**ට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. වෘත්තීය පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා, අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

a. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

b. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12.0 තනතුර සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් කළුතර පොලිස් විද්‍යාලයට අනුයුක්ත කරනු ලබන අතර ඔවුන් එම සේවා ස්ථානයේ සහ විශේෂ රාජකාරී අවස්ථා වලදී එම කටයුතු සඳහා ද වගකීමෙන් සහාය විය යුතුය.

13.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව පොලිස්පති විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

සී.ඩී.වික්‍රමරත්න
වැඩබලන පොලිස්පති

2019.05.23
පොලිස් මූලස්ථානයේදී.

අයදුම්පත් පහත සඳහන් ලිපිනයට යොමු කල යුතුය.

අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන)
නො.78, මුක්තාර් ප්ලාසා ගොඩනැගිල්ල,
දෙවන මහළ, ග්‍රෑන්ඩ්පාස් පාර,
කොළඹ 14.